# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2037/23 - 2017 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා - 2017.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී 24/51(iv)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

මෝටර් වාහන පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමඟ කියවිය යුතු (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2017 සැප්තැම්බර් මස 8 දිනැති අංක 2035/51 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 අංක 4 දරන මෝටර් වාහන (මෝටර් ට්‍රයිසිකල්) නියෝග පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) 1 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් ෘ-

''1. මෙම නියෝග 2017 අංක 4 දරන මෝටර් වාහන (මෝටර් ට්‍රයිසිකල්) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2018 ජනවාරි මස 1 වැනි දිනට සිට ක්‍රියාත්මක විය යුතු ය.'' ;

(2) 2(1) වන නියෝගය ''කුලියට තැනැත්තන් ප්‍රවාහනය කිරීමේ කාර්යය සඳහා අන්‍යාකාරයකින් '' යන වචන වෙනුවට ''කුලියට තැනැත්තන් ප්‍රවාහනය කිරීමේ කාර්යය සඳහා හෝ අන්‍යාකාරයකින් '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) 3(අ) නියෝගයේ ''අවම වශයෙන් මිලිමීටර් 382ක සහ මිලිමීටර් 250ක '' යන වචන වෙනුවට ''අවම වශයෙන් මිලිමීටර් 382 සහ මිලිමීටර් 230ක '' යන වචන ආදේශ කිරීමෙන් එම නියෝගය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10-207

1A - PG 3702— 507 (2017/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*